**මීගමුව මහා නගර සභාව**
**ගම්පහ දිස්ත්‍රික්කය**
**--------------------------**

1. මූල්‍ය ප්‍රකාශන.
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.
--------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 අප්‍රේල් 12 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 26 දින නාගරික කොමසාරිස්වරයාට යවා ඇත.

1.2 තත්වාගණනය කළ මතය
-----------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31දිනට මීගමුව මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.
----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) අගරු චෙක්පත් ලේඛනය අනුව නිරවුල් නොකල රු. 349,933 ක චෙක්පත් 02 ක් අවසාන ගිණුම් වලට ගෙන නොතිබුණි.

(ආ) වරිපනම් හා මිශ්‍ර ආදායම් සම්බන්ධයෙන් ලැබුණු රු. 913,572 ක චෙක්පත් අගරුවීම හේතුවෙන් නැවත ණයගැතියන් ලෙස ගිණුම්ගත නොකිරීම නිසා 2017 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් රු. 461,297 ක් හා හිඟ විවිධ ආදායම් රු. 452,275 ක් අඩුවෙන් පෙන්වා තිබුණි.

(ඇ) 2017 දෙසැම්බර් 31 දිනට පුස්තකාල 04 ක රු.5,500,227 ක් වටිනා පොත් තොගයක් ගිණුම්ගත කර නොතිබූ අතර එක් පුස්තකාලයක පොත් තොගයේ සත්‍ය වටිනාකමට වඩා රු. 1,618,922 ක් වැඩියෙන් ගිණුම් ගත කර තිබුණි.

(ඈ) හැමිල්ටන් ඇල බෝට්ටු ආශ්‍රිත සේවාව මගින් 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වූ කාල සීමාවට අදාලව අය කර තිබූ රු. 1,740,970 ක ආදායමක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයට අදාලව ගෙවිය යුතු රු.175,452 ක් ණයහිමියන් ලෙස ගිණුම් ගත කර නොතිබුණි.

(ඊ) ඉකුත් වර්ෂයේ ඉදිරියට ලැබූ වරිපනම් වටිනාකම රු.7,859,300 ක් වුවද සමාලෝචිත වර්ෂයේ ආදායමට ගෙන තිබුණේ රු.7,010,892 ක් බැවින් වරිපනම් ආදායම් රු.848,408 ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි.

(උ) උප කාර්යාල හා ප්‍රධාන කාර්යාලය විසින් වරිපනම් වට්ටම් ලෙස වාර්තා කර තිබූ නිවැරදි වටිනාකම රු.5,541,526 ක් වුවද රු.7,676,857 ක් වරිපනම් ගිණුමට කපා හැරීමෙන් වරිපනම් ආදායම රු.2,135,331 අඩුවෙන්ද දුන් වට්ටම් එම වටිනාකමින් වැඩියෙන්ද ගිණුම්ගත කර තිබුණි.

(ඍ) ඉකුත් වර්ෂය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ලද විමධ්‍යගත හා පළාත් සහා ආධාර රු.10,460,231 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේ ගිවිසුම්ගතවී තිබූ ව්‍යාපෘති 79 කට අදාලව රු.45,025,617 ක වටිනාකමක් සඳහා 2017 දෙසැම්බර් 31 දිනට ණයහිමි ප්‍රතිපාදන ඇතිකර නොතිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂයට අදාලව ලැබිය යුතු විමධ්‍යගත හා පළාත් සහා ආධාර රු.34,660,142 ක්, සමාලෝචිත වර්ෂයේ ආදායමට ගෙන නොතිබුණි.

1.3.2 නොසැසඳුණු ගිණුම්

------------------------

(අ) 2017 දෙසැම්බර් 31 දිනට ගිණුම් විෂයයන් 07 ක ගිණුම් අනුව ශේෂයන් හා එදිනට උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු. 20,126,189 ක වෙනසක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ ආදායම් විෂයයන් 05 ක් සම්බන්ධයෙන් මුල්‍ය ප්‍රකාශන හා පවත්වාගෙන යනු ලබන ලේඛන අතර රු.2,014,288 ක වෙනසක් පැවතුණි.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-------------------------------------

ලැබිය යුතු ගිණුම්

----------------------

(අ) 2017 දෙසැම්බර් 31 දිනට අගරු චෙක්පත් වල වටිනාකම වූ රු. 1,538,573 කින් රු. 1,298,850 ක් වටිනා චෙක්පත් 84 ක් වසර 5 ත් 25 ත් අතර වූ අතර ඒවා නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අගරු චෙක්පත් අංකය හෝ අයිතිකරු හඳුනා නොගත් රු. 281,589 ක් වටිනා චෙක්පත් 12 ක් හඳුනාගෙන නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2017 දෙසැම්බර් 31 දිනට රු. 4,315,735 ක් වූ විවිධ ණයගැති වටිනාකමෙන් රු.2,578,048 ක් වසර 10 ට වැඩි කාලයක සිට පැවත එන අතර ඒවා අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම.

-----------------------------------

උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා රු. 61,348,204 ක් වූ ගබඩා තොගය විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.5 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

---------------------------------------------------------------------------

නීති, රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) මහා නගර සභා ආඥා පනත 247(අ) | | ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇති හෝටල්, ආපන ශාලා හා ලැගුම්හල්වලින් බලපත්‍ර ගාස්තු වශයෙන් |

| | | | |
|---|---|---|---|
| | | | වර්ෂයේ ආදායමින් සියයට 1 නොඉක්ම විය යුතු වුවත් එයට පටහැනිව කාමර සංඛ්‍යාව පදනම් කරගෙන ගාස්තු අය කර තිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| | (i) මු.රෙ.110(1) | | හානි හා පාඩු ලේඛනයක් නඩත්තු කර තිබුණද හානි සම්බන්ධයෙන් විස්තර සටහන් පවත්වා නොතිබුණි. |
| | (ii) මු.රෙ.396 | 449,709 | 2017 දෙසැම්බර් 31 දිනට නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකල මාස 06 ඉක්මවා තිබූ වටිනාකම රු.449,709 ක් වූ චෙක්පත් 49 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| | (iii) මු.රෙ.571 | 923,961 | 2017 දෙසැම්බර් 31 දිනට විවිධ තැන්පතු ගිණුමෙහි වර්ෂ 02 ඉක්මවා තිබූ ශේෂය නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| | (iv) මු.රෙ.1645 | | ගිනි නිවන ඒකකය සතු කැබ් රථය නාගරික කොමසාරිස්වරයාගේ කාර්යයන් සඳහා පාවිච්චි කල අවස්ථාවන්හිදී දෛනික ධාවන සටහන්වල කොමසාරිස්වරයා විසින් අත්සන් යොදා නොතිබුණි. |
| (ඇ) | බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්ගේ 2016 පෙබරවාරි 29 දිනැති අංක 01/2016 දරන පාලන චක්‍රලේඛය | | |
| | (i) 1.2.2 වගන්තිය | | නිල වාහනයක් හිමි නිලධාරියෙකුට වෙනත් සංචිත වාහනයක් පරිහරණය කිරීමට හිමිකමක් නොමැති වුවද කොමසාරිස්වරයා විසින් නිලවාහනයට අමතරව වෙනත් වාහනයක්ද එකම දිනයන්හි පාවිච්චි කර තිබුණි. |
| | (ii) 1.2.3 වගන්තිය | | නාගරික කොමසාරිස්වරයා විසින් තම නිල වාහනයට අමතරව පාවිච්චි කල වාහනය සඳහාද ඉන්ධන ලබා දී තිබුණි. |
| | (iii)1.3 වගන්තියේ 1.3.2 උප වගන්තිය | | සංචිත වාහන සඳහා රාජකාරි අවශ්‍යතාවයන් මත මාසික ඉන්ධන සීමාවන් ආයතන ප්‍රධානියා හට නියම කල හැකි වුවද 2017 නොවැම්බර් 24 දිනැති අංක NMC/2/5/390 දරන නාගරික කොමසාරිස්වරයාගේ ලිපිය මගින් සංචිත වාහන 03 කට අමතරව ඔහුගේ නිල රථය සඳහා කොමසාරිස්වරයා විසින්ම ඉන්ධන සීමාවක් නියම කොට ගෙන තිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය
---------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.173,281,595 ක්වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට ඉක්ම වූ ආදායම රු.130,889,540 ක් විය.

2.2 ආදායම් පරිපාලනය
------------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්,රැස් කළ ආදායම් හා හිග ආදායම්
----------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්,රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳව තොරතුරු පහත දැක්වේ.

| | | **2017** | | | | **2016** | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| | | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| (i) | වරිපනම් හා බදු | 149,069 | 163,911 | 151,189 | 106,455 | 152,399 | 158,772 | 152,311 | 103,794 |
| (ii) | කුලී | 26,427 | 34,959 | 33,671 | 17,276 | 22,884 | 26,501 | 24,835 | 15,973 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 45,384 | 67,431 | 67,431 | 3,879 | 40,128 | 45,815 | 45,542 | 9,779 |
| (iv) | වෙනත් ආදායම් | 259,679 | 221,196 | 221,196 | 7,155 | 230,050 | 205,212 | 204,900 | 9,564 |

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) ඉකුත් වර්ෂය හා සසඳන කල සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත වරිපනම් ආදායම සියයට 02 කින් අඩුවී තිබූ අතර සමාලෝචිත වර්ෂයට ඇස්තමේන්තුගත වරිපනම් ආදායමට වඩා බිල් කිරීම සියයට 10 කින් වැඩිවී තිබූ හෙයින් ඇස්තමේන්තු කිරීම් තාත්වික ආකාරයෙන් කර නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂය හා සසඳන කළ සමාලෝචිත වර්ෂයේදී කුලී ආදායම් හිඟය වැඩිවී තිබුණි.

2.2.2 වරිපනම් හා බදු
-------------------

වරිපනම්
---------

(අ) 2017 ජනවාරි 01 දිනට රු.125,395,698 ක් වූ හිඟයෙන් අය කිරීම් රු.470,832,027 ක් වූ බැවින් හිඟ අය කිරීම් ප්‍රතිශතය සියයට 37.55 ක් විය.

(ආ) කොට්ඨාශ අංක 05 හි වරිපනම් අංක 355 දරන හෝටලයට 2014 සිට 2018 අගෝස්තු දක්වා වරිපනම් තක්සේරුවක් ලබාදී නොතිබූ අතර 2014 වර්ෂයේදී වරිපනම් ලෙස අයකර තිබුණේ රු.33

ක් පමණි. 2017 වර්ෂය වන විටත් ස්ථිර තක්සේරුවක් ලබාදීමට කටයුතු කර නොතිබූ අතර තාවකාලික තක්සේරුව මත කාර්තුවකට රු.675,278 ක් අය කර තිබුණි.

(ඇ) කොට්ඨාශ අංක 12 හි වරිපනම් අංක 772 දරන ස්ථානයේ ව්‍යාපාරය සඳහා 2014 වර්ෂයේදී වාහන විකුණුම් ස්ථානයක් ලෙස රු.2,531 ක් බැගින් වරිපනම් අය කර තිබූ අතර පසුව එය උත්සව ශාලාවක් සහිත සංචාරක හෝටලයක් ලෙස සංශෝධනය කර තිබුණද රු.2,531 ක වරිපනම් ගාස්තුව වෙනස් නොකර 2017 වර්ෂය දක්වාම අය කර තිබුණි.

(ඈ) කොට්ඨාශ අංක 08 හි වරිපනම් අංක 169 කොළඹ පාර යන ස්ථානයේ අනවසර ගොඩනැගිල්ලක් ඉදි කර තිබූ අතර ඒ සඳහා පසුව වරිපනම් අංකයක්ද ලබාදී තාවකාලික තක්සේරුවක් මත වරිපනම් අය කර තිබුණි. අනවසර ඉදිකිරීමක් සිදු වන අවස්ථාවේ ඒ සඳහා අදාල අංශ කටයුතු කර නොතිබුණි.

(ඉ) අන්තර් ජාලයෙන් බාගත කරන ලද හෝටල් ලැයිස්තුවකට අනුව,ඒවායේ වරිපනම් අයකිරීම් පිළිබඳ කොට්ඨාශ අංක 05 හා 04 වරිපනම් ලේඛනවල නියැදියක් පරීක්ෂා කල අතර ඒ අනුව හෝටල්/ව්‍යාපාරික ස්ථාන 28 ක් සඳහා නිවාසවලට අදාල වරිපනම් ප්‍රතිශතයට අනුව ගාස්තු අය කර තිබුණි.

2.2.3 කුලී

-------

කඩ කුලී

----------

(අ) සභාවට අයත් කඩ කාමර 36 ක් සඳහා 2017 දෙසැම්බර් 31 දිනට තව දුරටත් ලැබිය යුතු ටෙන්ඩර් හිඟ මුදල රු. 19,616,279 ක් වූ අතර කඩ කාමර 216 ක් සඳහා කුලී හිඟ ශේෂය රු.3,674,183 ක් විය. එම මුදල් අය කිරීම සඳහා නීතිමය ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

(ආ) සාප්පු සංකීර්ණය A ගොඩනැගිල්ල කඩ කාමර කුලියට දීමේදී ටෙන්ඩර් කොන්දේසි 05 අනුව දෙවන පක්ෂයට කඩ කාමර අනවශ්‍ය බව ප්‍රකාශ කලහොත් සභාවට ආපසු පවරා දියයුතු බව දක්වා තිබුණත්, දිගින් දිගටම පිළිගත් ටෙන්ඩර් ක්‍රමවේදයෙන් තොරව අයිතිය එක් එක් පුද්ගලයාට පවරාදී තිබුණි. මෙම ගොඩනැගිල්ලේ කඩ කාමර 102 ක් 1987 වර්ෂයේ සිට බදු දී තිබූ අතර ඒ සඳහා 2006 වර්ෂයේ ලබාදී තිබූ තක්සේරුව අනුව කුලිය අය නොකර සභා තීරණයකින් අඩු ගාස්තු ප්‍රමාණයක් අය කිරීම හේතුවෙන් එක් මාසයකදී රු. 298,925 ක් බැගින් 2006 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා සභාවට අහිමි වූ ආදායම රු. 40,653,800 ක් විය.

2.2.4 බලපත්‍ර ගාස්තු

------------------

(අ) වෙළඳ බලපත්‍ර

----------------

(i) සමාලෝචිත වර්ෂය සඳහා වෙළඳ බලපත්‍ර ගාස්තු අයකර නොගෙන ව්‍යාපාර පවත්වා ගෙන ගොස් තිබූ මීගමුව කාර්යාලයේ ආයතන 08 කින් අය වීමට තිබූ රු.28,414 ක් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ii) අන්තර් ජාලයෙන් බාගත කරන ලද ලැයිස්තුවකට අනුව සභාවට අයත් බල ප්‍රදේශයේ පිහිටි සංචාරක මණ්ඩලයේ අනුමත හෝටල්, ආපන ශාලා හා ලැගුම්හල් 153 කින් හෝටල්, ආපන ශාලා හා ලැගුම්හල් 81 ක් බලපත්‍ර ලබාගෙන නොතිබුණි.

(ආ) ව්‍යාපාර බදු

-------------

සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපාර බදු අයකර නොගෙන ව්‍යාපාර පවත්වා ගෙන ගොස් තිබූ මීගමුව කාර්යාලයේ ව්‍යාපාර ආයතන 05 කින් අය වීමට තිබූ රු. 16,962 ක් සම්බන්ධයෙන් සභාව විසින් නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2.2.5 වෙනත් ආදායම්

------------------

(අ) 2017 වර්ෂයට කසළ අපහරන ගාස්තු ඇස්තමේන්තුගත ආදායම රු.2,500,000 ක් වුවද එකතු කල ආදායම රු.365,000 ක් වූයෙන් ඇස්තමේන්තු ඉලක්කය කරා ලඟාවී නොතිබුණි.

(ආ) සභාවට අයත් කාමච්චෝඩය මාළු වෙළඳපල අසල මාර්ගයේ ගාල් කරන වාහන සඳහා ගාස්තු අය කිරීම වැල්ලවීදිය දේවස්ථානය මගින් සිදුකර තිබූ අතර සභාව සතු එම අයිතිය බාහිර පුද්ගලයන්ට/ආයතනවලට පැවරීම සම්බන්ධයෙන් අනුමැතියක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 කාර්යසාධනය

------------------

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම,ජනතාවගේ සුබවිහරණ පහසුව හා සුභසාධනය සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ක්‍රියාකාරී සැලැස්ම

----------------------

සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් කාර්යයන් 25 ක් ඉටු කර නොතිබුණි.

(ආ) ඉටු නොකල කර්තව්‍යයන්

------------------------------

(i) ගිවිසුම් ගතවූ රු. 9,546,311 ක් වටිනා කොන්ත්‍රාත් 18 ක් සභාව විසින් අවලංගුකර තිබුණි.

(ii) සභාව විසින් 2017 වර්ෂයේ අයවැය ලේඛනය මගින් ඉටුකිරීමට සැලසුම් කල රු.5,000,000 ක් වටිනා ව්‍යාපෘති 08 ක් ඉටුකර නොතිබුණි.

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

----------------------------

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව විසින් දැනුවත්වීමක් සිදුව නොතිබුණි.

3.2 කළමණාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

(අ) මහජන පැමිණිලි ලේඛනය අනුව 2016 වර්ෂයේ ලැබී ඇති මහජන පැමිණිලි 85 කින් 78 ක් හා 2017 වර්ෂයේ ලැබී ඇති මහජන පැමිණිලි 101 කින් 86 ක් විසඳා නොතිබූ අතර එම ලේඛනය යාවත්කාලීනද කර නොතිබුණි.

(ආ) මහා නගර සභාවට අයත් කාමච්චෝඩය පොළ අසල සභාවට අයත් ඉඩමක නිවාස 12 ක් ඉදිකර තිබූ අතර ඒ සම්බන්ධයෙන් සභාව කටයුතු කර නොතිබුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

(අ) බස් නැවතුම් පොළ විවෘත ශාලාවේ 24' x 38' වර්ග ප්‍රමාණයක් වූ ප්‍රදේශයක අඩි 01ක් දිග හා අඩි 01 පළල ප්‍රමාණයේ සවි කර තිබූ ටයිල් ගැලවී තිබුණි.තවද එහි අංක 23 දරන කඩ කාමරය හා ඊට ඉහලින් වූ කඩ කාමරය එකම ටෙන්ඩර්කරුවෙකු විසින් ලබාගෙන එහි උඩුමහලට යැමට තරප්පු පෙළක් සවිකිරීම සඳහා එහි කොන්ක්‍රීට් තට්ටුව කඩා දමා එම කොටස කාඩ්බෝඩ් වලින් වසා දමා තිබුණි.මේ සම්බන්ධයෙන් කිසිදු පියවරක් සභාව විසින් ගෙන නොතිබුණි.

(ආ) මීගමුව රාජපක්ෂ උද්‍යානයේ තිබූ දුර්ලභ ගස් විශේෂයක් වන ගම්මාලු ගස, පාරමාර ගස හා තවත් ගස් කිහිපයක් ප්‍රාදේශිය ලේකම් හා දිසා වන නිලධාරීගේ අවසරයකින් තොරව අනතුරුදායක ගස් ඉවත් කිරීම යටතේ කපා දැමීමට සභා නිලධාරින් විසින් කටයුතු කර තිබුණි. කපා දමන ලද ගම්මාලු ගස කොටස් කර, කොටස් 28 ක් පමණක් අංක කර මිමී ගැනීමට අපහසු ලෙස අසුරා තිබුණි.විශාල වට ප්‍රමාණයක් සහිත පාරමාර ගස රු. 32,675 කට තක්සේරු කර 2018 පෙබරවාරි 23 දින වන විටත් ඉවත් කර තිබූ අතර එම කොටස් ප්‍රමාණය කොතෙක්ද යන්න වාර්තා නොවුණි.ගස් කැපීම හැර අනෙකුත් කටයුතු සභාවේ කම්කරුවන් ලවා සිදු කළ හැකිව තිබියදී ඒ සඳහා කම්කරු කුලී වශයෙන් රු. 69,000 ක් ඇස්තමේන්තු කර තිබුණි

(ඇ) මීගමුව සාප්පු සංකීර්ණයේ F ගොඩනැගිල්ලේ කඩ කාමර 15 කින් 14 ක්, නව බස්නැවතුම්පල සාප්පු සංකීර්ණයේ බිම් මහල එක් කඩ කාමරයක්,පලමු මහල කඩ කාමර 06 ක්, දෙවන මහල විවෘත ශාලාව, සාප්පු සංකීර්ණයේ D ගොඩනැගිල්ලේ කඩ කාමර 03 ක් හා සභාවට අයත් හිස් බිම් තීරු 07 ක් කුලී පදනම මත බාහිර පාර්ශවයන්ට 2002 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ගිවිසුම් අත්සන් කිරීමකින් තොරව ලබාදී තිබුණි.

(ඈ) සාප්පු සංකීර්ණයේ A ගොඩනැගිල්ලේ කඩ කාමර 1986 වර්ෂයේ සිට අඛණ්ඩව ටෙන්ඩර් කිරීමකින් තොරව බදු කරුවන් අතර හුවමාරුවී තිබූ අතර කුලියට දීමේදී හුවමාරු කිරීමට පහසුවන අයුරින් ගිවිසුම්වල කොන්දේසි යොදා සභාව විසින් ඒ සඳහා පහසුකම් සලසා තිබුණි. කඩ කාමර 54 කින් 10 ක නියැදි පරීක්ෂාව අනුව එම කඩ කාමර එක් එක් පුද්ගලයින් අතර හුවමාරු වී තිබූ අවස්ථා ගණන 3 සිට 7 දක්වා විය.

(ඉ) සභාව සතු ඉඩම් කැබලි කඩ කාමර ඉදිකිරීම සඳහා පෞද්ගලික අංශ වෙත බදු දී තිබූ අතර 2018 ජූලි 18 දින වනවිට බිම් කැබලි 25 ක කඩ ඉදිකිරීම් කර තිබුණි. මෙයින් හිස් බිම් තීරු 11 කට පමණක් ටෙන්ඩර් කිරීමෙන් පසු කඩ ඉදිකර ගැනීම සඳහා අවස්ථාව ලබා දී තිබුණි. කඩ කාමර ඉදිකිරීම සඳහා සැලසුම් අනුමත කර නොතිබුණු අතර සමහර කඩකාමර මේ වන විට තෙවන මහල දක්වා ඉදිකිරීම් කර තිබුණි.

(ඊ) කාමච්චෝඩය බදාදා පොළ 2017 වර්ෂය සඳහා බදු දීමේදී ලද වැඩිම ලංසුවේ වටිනාකම රු.18,252,000 ක් වූ අතර ජයග්‍රාහී ටෙන්ඩර්කරු ලංසුව භාරගැනීම ප්‍රතික්ෂේප කිරීම නිසා රු.13,572,000 ක් වූ දෙවන ලංසුකරුට පොළ බදු දීම හේතුවෙන් සභාවට අහිමි වූ ආදායම රු.4,680,000 ක් විය. පළමු ටෙන්ඩර්කරු ලංසුව ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් සභාවට සිදුවූ පාඩුව අවම කර ගැනීම සඳහා 2016 දෙසැම්බර් 21 දිනැති කළමනාකරණ තීරණය මගින් බැංකු ඇපකරය වූ රු.1,000,000 ක මුදලින් රු.500,000 ක් සභා සතුකර ගැනීමට තීරණය කර තිබුණද ටෙන්ඩර්කරුවන් සමඟ නීතිමය බැඳීමක් ඇති කර ගැනීම සඳහා අවශ්‍ය ටෙන්ඩර් කොන්දේසි සභාව විසින් සපුරා/දක්වා නොතිබීම හේතුවෙන් එම මුදල් අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(උ) කාමච්චෝඩය ඉරිදා පොළ 2017 වර්ෂය සඳහා බදු දීමේදී ලද වැඩිම ලංසුවේ වටිනාකම රු.22,816,500 ක් වූ අතර 2016 දෙසැම්බර් 15 දින ජයග්‍රාහී ටෙන්ඩර්කරු ලංසුව භාරගැනීම ප්‍රතික්ෂේප කිරීම නිසා රු.18,603,000 ක් වූ දෙවන ලංසුකරුට ටෙන්ඩරය ලබාදීම හේතුවෙන් සභාවට අහිමි වූ ආදායම රු.4,213,500 ක් විය. පළමු ටෙන්ඩර්කරු ලංසුව ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් සභාවට සිදුවූ පාඩුව අවම කර ගැනීම සඳහා 2016 දෙසැම්බර් 31 දිනැති කළමනාකරණ කමිටු තීරණය මගින් බැංකු ඇපකරය වූ රු.1,000,000 ක මුදලින් රු.500,000 ක් සභා සතුකර ගැනීමට තීරණය කර තිබුණද , ටෙන්ඩර්කරුවන් සමඟ නීතිමය බැඳීමක් ඇති කර ගැනීම සඳහා අවශ්‍ය ටෙන්ඩර් කොන්දේසි සභාව විසින් සපුරා/දක්වා නොතිබීම හේතුවෙන් එම මුදල් අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඌ) සෙනසුරාදා රාත්‍රී පොළ 2017 වර්ෂය සඳහා බදුගත් බදුකරු විසින් 2017 ජූනි 10 දින ඒකපාර්ශිකව ගිවිසුමෙන් ඉවත්වී තිබූ අතර ගිවිසුම අත් හැරීම හේතුවෙන් සභාවට සිදුව තිබූ රු.1,304,928 ක පාඩුවද නොසලකා 2017 ජූලි 20 දිනැති කළමනාකරණ කමිටු තීරණය යටතේ 2017 අගෝස්තු 27 දින රු.1,672,312 ක ටෙන්ඩර් තැන්පත් මුදල නිදහස් කර තිබුණි. ටෙන්ඩර්කරුවන් සමඟ නීතිමය බැඳීමක් ඇති කර ගැනීම සඳහා අවශ්‍ය ටෙන්ඩර් කොන්දේසි සභාව විසින් සපුරා/දක්වා නොතිබීම හේතුවෙන් එම මුදල් අයකර ගැනීමට නොහැකි වී තිබූ අතර ගිවිසුම උල්ලංඝණය කල ටෙන්ඩර්කරු අසාධු ලේඛනගත කිරීමට සභාව කටයුතු නොකිරීම හේතුවෙන් දෙවන වර මිල ගණන් කැඳමේදී ඔහුද නැවත ලංසු තබා තිබුණි.

3.4 වත්කම් කළමනාකරණය
----------------------------

3.4.1 භාණ්ඩ සමීක්ෂණය
--------------------

(අ) සමීක්ෂණයක් කර සභාව සතු දේපල හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභාව සතු වාහන 127 හි සමාලෝචිත වර්ෂය සඳහා සමීක්ෂණයක් සිදු කර නොතිබුණි.

3.4.2 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම
-------------------------------------------

(අ) මීගමුව නගරයේ රමණී මාවතේ පිහිටි පර්චස් 25.4 ක් වූ පොදු ඉඩමේ හා රිදී වැලි පාර රූඩ් 01 පර්චර්ස් 20.5 ක පොදු ඉඩමේ අනවසර ලෙස බාහිර පාර්ශ්වයන් විසින් ගොඩනැගිලි ඉදි කරමින් පෞද්ගලික පරිහරණය සඳහා යොදා ගෙන තිබුණි.

(ආ) සභාව සතුව පවතින ඉඩම් 334 කින් ඉඩම් 100 ක් සඳහා ඔප්පු සභාව සතුව නොතිබුණි.

3.4.3 නිශ්ක්‍රීය වත්කම්
----------------

තලාදූව පෙර පාසැල ආසන්නයේ ඇති ණැන සල පවත්වා ගෙන ගිය නගර සභා ගොඩනැගිල්ල කිසිදු ප්‍රයෝජනයකට නොගෙන අත් හැර දමා තිබුණි.

3.5 ආර්ථික නොවූ ගනුදෙනු

----------------------------

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ පළාත්බඳ මාර්ග සංවර්ධන අධිකාරිය මගින් 2013 වර්ෂය ඉදිකර තිබූ කාමච්චෝඩය සති පොළෙහි නව ගොඩනැගිලි 04 ක් ඉදි කිරීමට සහ පැරණි ගොඩනැගිල්ලක් අලුත්වැඩියාවට හා වැසිකිළි සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීමට රු.151,025,802 ක් වැය කර තිබුණි. 2018 අගෝස්තු 28 දින වන විටත් නව ගොඩනැගිලි 04 න් එක් ගොඩනැගිල්ලක් හා අලුත්වැඩියා කරන ලද පැරණි ගොඩනැගිල්ලේ කොටසක් විශාල අඩුපාඩු නිසා භාවිතයට නොගෙන තිබූ අතර උපකරණවලින් ඇඳුම් රාක්ක 216 ක් හා එළවළු රාක්ක 95 ක් භාවිතයට ගෙන නොතිබුණි. තවද මෙම ගොඩනැගිලි සඳහා 2013 වර්ෂයේ අග භාගයේ සිට වසර 10 ක් ගාස්තු රහිත නඩත්තු හා වගකීම් කාලයක් පැවතියද එම ගොඩනැගිලි කිසිදු නඩත්තුවක් කර නොතිබුණි. සති පොළ ඉදිකර අවසන් වීමේදී ගොඩනැගිල්ලේ විශාල අඩුපාඩු 30 ක් ඇති බව වාර්තාවී තිබූ අතර 2017 ඔක්තෝබර් 27 දින වන විටත් එම අඩුපාඩු සම්පූර්ණ කර නොතිබුණි.

3.6 අවිධිමත් ගනුදෙනු

-------------------

භාණ්ඩ ලැබීමට පෙර බාහිර ආයතනයේ නමට චෙක්පත් ලියා සභාවේ නිලධාරීන් කිහිපදෙනෙකු වෙත භාරදී එය නිලධාරීන්ට දුන් අත්තිකාරමක් ලෙස සටහන් කර භාණ්ඩ ලැබීමෙන් පසු ආයතනයට ගෙවීමේදී අත්තිකාරම පියවීමට කටයුතු කර තිබුණි. 1986 වර්ෂයේ සිට එසේ නිකුත් කර තිබූ රු.17,028,297 ක් වූ චෙක්පත් 363 ක් නිරවුල්වී නොතිබූ අතර නියැදි පරීක්ෂාවට අනුව එසේ චෙක්පත් ලියා ඇනවුම් කළ දින සිට භාණ්ඩ ලැබීම වර්ෂ 01 සිට වර්ෂ 05දක්වා ප්‍රමාද වූ අවස්ථා 06 ක් විය.

3.7 ප්‍රසම්පාදනය

----------------

3.7.1 ප්‍රසම්පාදන සැලැස්ම

--------------------

සමාලෝචිත වර්ෂය සඳහා සභාව විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

3.7.2 සැපයීම් හා සේවා

-------------------

(අ) මීගමුව මහා නගර සභාව ඇතුළු වෙනත් ස්ථාන සඳහා 2015 ජනවාරි 01 සිට 2017 දෙසැම්බර් 31 දක්වා වසර 03 කට ආරක්ෂක සේවාව සැපයීමට ඇගයීම් කමිටුව විසින් ආරක්ෂක ආයතනයක් නිර්දේශ කර තිබුණි.ගිවිසුමේ කොන්දේසි 8 අනුව රුපියල් ලක්ෂ 10 ක බැංකු ඇපකරයක් ලබාගෙන නොතිබූ අතර කොන්දේසි 15 ට අනුව සභාවට සිදුවන අලාභ හා හානි වෙනුවෙන් රුපියල් ලක්ෂ 10 කට නොඅඩු ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ වගකීම් ඔප්පුවක් මගින් ඇප තැබිය යුතු වුවද, ලබා ගෙන තිබුණේ 2015 ජනවාරි 29 දින දක්වා වලංගු රු.100,000 ක ඇප ඔප්පුවකි. තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය අනුව තෝරා ගත් 2 වන ටෙන්ඩර්කරුගේ මිලට වඩා 1 වන ටෙන්ඩර්කරුගේ මිල ස්ථාන භාර නිලධාරිගේ වැටුප රු.35 කින් අඩුවීම හා ආරක්ෂක නියාමක වැටුප රු.9 කින් වැඩිවීම සුළු වැඩිවීමක් ලෙස සලකා 1 වන ටෙන්ඩර්කරු තෝරාගෙන තිබුණි. සංඛ්‍යාත්මක වශයෙන් ගත්කල ගෙවීම් කරනු ලබන්නේ ස්ථාන භාර නිලධාරි 124 කට හා සාමාන්‍ය ආරක්ෂක නියාමකවරුන් 1,100 ක් සඳහා වන හෙයින්,අවුරුදු 03 ක් සඳහා රු.200,160 ක පාඩුවක් සභාවට සිදුවී තිබුණි

(ආ) 2014 ඔක්තෝබර් 03 සිට 2017 ඔක්තෝබර් 03 දක්වා අවුරුදු 03 ක කාල සීමාවකට ප්‍රධාන බස්නැවතුම්පොළ හා ඒ අවට පරිශ්‍රය පිරිසිදු කිරීම සඳහා ඇගයීම් කමිටුව විසින් ඉල්ලා ඇති සුදුසුකම් හා ඉදිරිපත් කර ඇති මිළ ගණන් සළකා රු.280,000 ක මිළ ගණන් ඉදිරිපත් කර තිබූ පුද්ගලික සමාගමක් නිර්දේශ කර තිබුණි.එහෙත් එම නිර්දේශය නොසලකා මුදල් කමිටුව විසින්

ඊට වඩා ඉහළ මිලක් වන රු.392,157 ක් ඉදිරිපත් කර තිබූ වෙනත් ආයතනයක් තෝරා ගැනීම නිසා මසකට රු.112,157 බැගින් වසර 03 ක් සඳහා රු.4,620,862 ක පාඩුවක් සභාවට සිදුව තිබුණි.ගිවිසුමේ කොන්දේසි 2 ප්‍රකාරව, දිවා කාලයේදී පරීක්ෂකවරයෙකු හා කම්කරුවන් හතර දෙනෙකුද, රාත්‍රී කාලයේදී කම්කරුවන් හතර දෙනෙකුද සේවයේ යෙදිය යුතු වුවත් 2017 සැප්තැම්බර් 29 දින ස්ථානීය පරීක්ෂාවේදී දහවල් කාලයේදී කම්කරුවන් තිදෙනෙකු හා අධීක්ෂකයෙකුද රාත්‍රී කාලයේදී කම්කරුවන් හතර දෙනෙකු හා අධීක්ෂකයෙකු සේවයේ යොදවා තිබුණි.තවද,ගිවිසුමේ 10 වන වගන්තිය ප්‍රකාරව, තෙවන පාර්ශ්වයකට තුන්වන මහල බදු දෙන තුරු එම මහල සහ ශාලාව දිනපතා පිරිසිදු කිරීම සිදුකල යුතු වුවත් එසේ කර නොතිබුණි.

(ඇ) මහා නගර සභාවේ පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා උපදේශක ආයතනයක් තෝරා ගැනීමට මිල ගණන් කැඳවීමේදී මීගමුව ප්‍රදේශයේ පදිංචි උපදේශකවරුන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙන බව පුවත්පත් දැන්වීමේ පලකර නොතිබියදී මුදල් කමිටුව විසින් පදිංචිය සඳහා ප්‍රමුඛතාවය ලබාදී 2012 වර්ෂයේ සභාවේ ක්‍රියාත්මක ව්‍යාපෘති වෙනුවෙන් තෝරාගත් උපදේශන ආයතනයම 2013 වර්ෂයේ මහජන පුස්තකාලය සඳහා ද තෝරගෙන ගිවිසුම් ගතවී තිබුණි. ඇස්තමේන්තු වටිනාකමින් සියයට 3 ක් වූ උපදේශක ගාස්තුව අදියර 06 ක් යටතේ ගෙවීම් කිරීමට තිබියදී හා එහි අදියර 04 ක් දක්වා රු.3,656,534 ක් ගෙවා තිබියදී 2015 ජූනි 07 දින වාණිජ පහසුකම්වලින් සමන්විත පුස්තකාලයක් ඉදිකිරීමට නැවත සැලසුම් සකස් කරන ලෙස ඉහත උපදේශක සමාගමට දන්වා තිබුණි. ඒ අනුව උපදේශක ගාස්තුව සියයට 3 වෙනුවට සියයට 6 ක ගාස්තුවකට ගිවිසුම්ගත වීම නිසා උපදේශක ගාස්තුව රු.5,223,620 සිට රු.11,146,615 දක්වා රු.5,922,995 කින් වැඩිවී තිබූ අතර ඒ සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශයක් නොතිබුණි.ගිවිසුම් ගතවීමට පෙර සැලසුම් සහගත ලෙස සභාව විසින් කටයුතු නොකිරීම නිසා 2017 සැප්තැම්බර් 20 දින වන විට එම මුදලින් සභාවට පාඩුවක් සිදුව තිබුණි.

3.7.3 කොන්ත්‍රාත් පරිපාලනය
--------------------------

(අ) 2000 වර්ෂයේ ඉදිකර ඇති කුරණ මේජර් රාජ් ක්‍රීඩාංගනයේ පිහිටි මළ අපහරණ පද්ධතිය 2010 වර්ෂය වනවිට මුලුමනින්ම අක්‍රිය වී තිබීම හේතුවෙන් 2014 ජනවාරි මාසයේ තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය මත ආයතනයක් තෝරාගෙන තිබියදී, වෙනත් සමාගමක් ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කිරීම නිසා එයද ක්‍රියාත්මක නොවීම මත නැවත වසර 02 කට පසු මිල ගණන් කැඳවීම සිදුකර වැට් සහිතව රු.10,378,500 ක මුදලකට නිම කිරීමට 2014 ජනවාරි මාසයේ තෝරාගත් ආයතනය සමඟම 2016 ඔක්තෝබර් 10 දින මාස 03 කින් නිම කිරීමට ගිවිසුම් ගතවී තිබුණි. නිසි කළට තීරණ නොගැනීම නිසා වසර 02 ක් පමාවීම හේතුවෙන් රු.3,907,800 ක පාඩුවක් සභාවට සිදුව තිබූ අතර එසේ කල් දැමීම හේතුවෙන් 2014 වර්ෂයේ සිට කුරණ සිට ජා-ඇල ඒකල පිහිටි ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත සභාව හා පුද්ගලික ආයතනයක් මගින් අප ජලය බැහැර කිරීම වෙනුවෙන් එකතුව රු.10,153,475 ක් සභාව විසින් ගෙවා තිබුණි. 2017 අප්‍රේල් 10 දින දක්වා මෙම ව්‍යාපෘතියේ දින දීර්ඝ කරගෙන තිබු නමුත් 2017 දෙසැම්බර් 31 වන විටත් මළ අපහරණ පද්ධතිය සකස් කර නිමා කර ගැනීමට සභාව අපොහොසත් වී තිබූ අතර, 2017 මැයි හා ජූලි මාසය දක්වා ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට ගෙවූ රු.517,500 ක මුදල සභාවට පාඩුවක් වී තිබුණි.

(ආ) ඇස්තමේන්තු වටිනාකම රු.5,285,603 ක්වූ නාගරික කොමසාරිස් නිල නිවස ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවේ වැඩ විෂයයන් 06 ක ඇස්තමේන්තු පිරිවැය හා කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර තිබූ පිරිවැය අතර ප්‍රමාණාත්මක විචලනයන් නිරීක්ෂණයවූ අතර ඒ සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7:9:11(අ) හි විධිවිධාන ප්‍රකාරව,ලංසුකරුගෙන් අනුප්‍රමාණ විශ්ලේෂණයක් විමසා නොතිබුණි. මෙම විෂයයන් 06 හැර අනෙකුත් විචලනයන් සම්බන්ධයෙන් 2017 මාර්තු 30 දිනැති තාක්ෂණික ඇගයීම් කමිටුව විසින්, හේතු විමසා තිබුණද එය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. තවද ගිවිසුම්ගත දින සිට මාස 06 ක කාල සීමාව

ඇතුළතදී කොන්ත්‍රාත්තුව නිම කළ යුතු වුවද 2018 ජූලි 20 දින දක්වා කොන්ත්‍රාත්තුව නිම කර නොතිබූ බැවින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.14.1 හි විධි විධාන නොසලකා, ඇස්තමේන්තු සකස් කිරීමේදී ඇතිව තිබූ යම් යම් අඩුපාඩු දක්වමින් ඉදිරිපත් කර තිබූ කොන්ත්‍රාත්කරුගේ කාලය දීර්ඝ කිරීමේ ඉල්ලීම සඳහා අනුමැතිය ලබාදී 2018 ජනවාරි 02 දින දක්වා කාලය දීර්ඝ කර තිබූ අතර ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි. කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම හේතුවෙන් කාර්ය සාධන සුරක්ෂණයෙහි, කාලය දීර්ඝ කර ගැනීම සඳහා පියවර ගෙන නොතිබූ අතර 2018 අගෝස්තු 03 දින වන විට කොන්ත්‍රාත්තුව අවසන් කර තිබුණද ටයිල් ඇතිරීම ,දොරවල් හා ජනේල්වල උපාංග හා විදුලි උපකරණ සවි කිරීමේ අඩුපාඩුකම් 20 ක් දක්නට ලැබුණි.

(ඇ) කොච්චිකඩේ බල ප්‍රදේශයේ කසළ ඉවත් කිරීම සඳහා 2014 සැප්තැම්බර් 01 දින සිට 2017 අගෝස්තු 01 දින දක්වා වසර 03 ක කාලයකට පිළිවෙලින් රු.1,755,600 ක්,1,843,380 ක් හා 1,935,549 ක් යන වටිනාකම්වලට පෞද්ගලික ආයතනයක් සමඟ ගිවිසුම් ගතවී තිබුණි.ගිවිසුම අනුව මුළු වාර්ෂික වටිනාකමින් සියයට 5 ක පිළිගත් රාජ්‍ය වාණිජ බැංකුවක ආරක්ෂිත බැංකු ඇපකරයක් ඉදිරිපත් කළ යුතු වුවත් පළමු වසරේ වාර්ෂික වටිනාකමින් සියයට 5 ක් වන රු.1,053,360 ක බැංකු ඇපකරයක් ලබාගෙන ඉදිරි වර්ෂ 02 ක සඳහාද එම ඇපය එලෙසම ලබා ගෙන තිබුණි. 2018 ජූලි 31 දින දක්වා මෙම ගිවිසුම නැවත දීර්ඝ කර තිබුණද එම කාලය සඳහා ආරක්ෂිත බැංකු ඇපකරයක් ලබා ගෙන නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
-------------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2018 අප්‍රේල් 12 දිනදීය.

5. පද්ධති හා පාලන
-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර කොමසාරිස්වරයාගේ අවධානයට යොමුකර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) | ගිණුම්ගත නොකිරීම් පැවතීම. |
| | | (ii) | ශේෂ වෙනස්කම් පැවතීම. |
| (ආ) | ආදායම් පාලනය. | (i) | පෙර මුදල් හා හිඟ අය කිරීමට කටයුතු නොකිරීම. |
| | | (ii) | ආදායම් අය කර ගැනීමේ නව මාර්ග වෙත යොමු නොවීම. |
| (ඇ) | ව්‍යාපෘති පාලනය | (i) | උපදේශකයින් තෝරා ගැනීමේ දුර්වලතාවයන් තිබීම. |
| | | (ii) | ඉදි කිරීම්වල අඩුපාඩු පැවතීම. |
| (ඈ) | වාහන පාලනය | (i) | වාහන සමීක්ෂණයක් සිදු නොකිරීම. |
| | | (ii) | වාහන අනතුරු සම්බන්ධයෙන් පරීක්ෂණ නොපැවැත්වීම. |
| (ඉ) | වත්කම් පාලනය | (i) | වත්කම්වල ආරක්ෂාව සම්බන්ධයෙන් කටයුතු නොකිරීම. |
| | | (ii) | පොදු දේපල අනිසි භාවිතයට ඉඩ හැරීම. |

| | ව්‍යාපාර වර්ගය | ආයතන සංඛ්‍යාව | අභිමිව් තිබූ බලපත්‍ර ගාස්තු වටිනාකම |
|---|---|---|---|
| | ----------------- | ------------- | -------------- |
| | | | රු. |
| 01 | තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම | 15 | 9,025 |
| 02 | භෝජනාගාරයක් පවත්වා ගැනීම | 13 | 24,750 |
| 03 | ආපන ශාලාවක් පවත්වාගෙන යාම හෝ පීසාහට් එකක් පවත්වාගෙන යාම | 12 | 36,500 |
| 04 | බත් කඩයක් පවත්වාගෙන යාම | 10 | 18,250 |
| 05 | බේකරියක් පවත්වාගෙන යාම | 03 | 5,500 |
| 06 | පොදු ලැගුම්හලක් පවත්වාගෙන යාම | 19 | 54,500 |
| 07 | පදිංචි නිවසකින් කොටසක පොදු ලැගුම්හලක් පවතවාගෙන යාම | 01 | 3,000 |
| 08 | සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටලයක් | 01 | 14,641 |
| 09 | සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි ලැගුම්හලක් | 02 | 58,564 |
| 10 | බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම | 16 | 12,050 |
| 11 | සරුවත් පළතුරුබීම/සහල් වෙළඳාම | 05 | 2,950 |
| 12 | කරවල හොන්ඩර 03 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම | 02 | 2,250 |
| 13 | ඇඹරුම්හලක් පවත්වාගෙන යාම | 07 | 28,000 |
| 14 | භූමිතෙල් ගැලුම් 25 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම | 01 | 2,000 |
| 15 | මත්පැන් සිල්ලර අලෙවිය | 04 | 20,000 |
| 16 | ගෘහ භාණ්ඩ නිෂ්පාදනය | 01 | 2,500 |
| 17 | අවමංගල සේවා | 02 | 10,000 |
| 18 | සිසිල්බීම සිල්ලර විකුණන ස්ථානයක් | 05 | 7,250 |
| 19 | ආයුර්වේද ඖෂධ හා තෙල්වර්ග නිෂ්පාදනය කිරීම/විකිණීම | 03 | 2,500 |
| 20 | මාළු වෙළඳාම | 03 | 1,425 |
| 21 | කේටරින් සේවා | 03 | 11,250 |
| 22 | ස්වයං සේවා වෙළඳ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 01 | 4,000 |
| 23 | උත්සව සඳහා කේක් රසකැවිලි වර්ග නිෂ්පාදනය කිරීම හෝ සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 05 | 3,500 |
| 24 | එළවළු වෙළඳාම | 04 | 2,000 |
| 25 | පළතුරු වෙළඳාම | 05 | 2,750 |
| 26 | අධිශිතකල මාළු හෝ මස් ගබඩා කිරීම/විකිණීම | 09 | 29,000 |
| | | 152 | 368,155 |
| | | ==== | ======= |

ඇමුණුම 02

බ
ස්ගාල්ගා
ස්තුඅඩුවෙ
න්ගෙවීම.

| දිනය | මාර්ගස්ථමගී ප්‍රවාහනඅධිකාරීවාර්තාඅනුව ධාවනයවූබස් රථගණන | ධාවනය වූ වාර ගණන අනුව ගෙවිය යුතු වටිනාකම | ගෙවා ඇති ගාස්තු වටිනාකම | අඩුවෙන් ගෙවා ඇති වටිනාකම |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| 2015.03.16 | | 24,150.00 | 12,900.00 | 11,250.00 |
| 2015.03.17 | 483 | 23,900.00 | 12,950.00 | 10,950.00 |
| 2015.03.18 | 494 | 24,700.00 | 13,050.00 | 11,650.00 |
| 2015.03.19 | 458 | 22,900.00 | 13,100.00 | 9,800.00 |
| 2015.03.20 | 507 | 25,350.00 | 12,650.00 | 12,700.00 |
| 2015.03.21 | 453 | 22,650.00 | 9,750.00 | 12,900.00 |
| 2015.03.22 | 329 | 16,450.00 | 8,050.00 | 8,400.00 |
| 2015.03.23 | 524 | 26,200.00 | 12,800.00 | 13,400.00 |
| 2015.03.24 | 468 | 23,400.00 | 12,600.00 | 10,800.00 |
| 2015.03.25 | 496 | 24,800.00 | 13,100.00 | 11,700.00 |
| 2015.03.26 | 501 | 25,050.00 | 12,900.00 | 12,150.00 |
| 2015.03.27 | 506 | 25,300.00 | 11,550.00 | 13,750.00 |
| 2015.03.28 | 492 | 24,600.00 | 9,400.00 | 15,200.00 |
| 2015.03.29 | 389 | 19,450.00 | 11,650.00 | 7,800.00 |
| 2015.03.30 | 526 | 26,300.00 | 12,500.00 | 13,800.00 |
| | | **355,200.00** | **178,950.00** | **176,250.00** |